G.C.E. ORDINARY LEVEL

අ.පො.ස. සාමාන්‍ය පෙළ

STUDENT SEMINAR SERIES - 2017

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017

INFORMATION & COMMUNICATION TECHNOLOGY

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

QUESTION PAPER - I

ප්‍රශ්න පත්‍රය - I

Powered by

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව The National e-learning Portal for The General Education

සා/පෙළ සිත්මිණ

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉ-ඉගෙනුම් හා නැණස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017

80 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I

11 ශ්‍රේණිය	සිංහල මාධ්‍යය	කාලය - පැ 2

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*
- *අංක 1 - 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1),(2),(3),(4) පිළිතුරුවලින් නිවැරදි /වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.*

1. චාර්ල්ස් බැබේජ් විසින් නිපදවන ලද යන්ත්‍රය වන්නේ,
   (1). Mark I
   (2). Abacus
   (3). Analytical engine
   (4). Pascaline

2. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් පරිගණකයක් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
   (1). පරිගණකය තොරතුරු සකස් කිරීම සිදු කරයි.
   (2). පරිගණකය යනු ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත නිවැරදිව හා ඉක්මණින් ගබඩා කිරීම, නැවත ලබා ගැනීම හා සකස් කිරීම සිදුකරගත හැකි විද්‍යුත් උපකරණයකි.
   (3). පරිගණකය යනු ගුණාත්මක දත්ත පමණක් නිවැරදිව හා ඉක්මණින් ගබඩා කිරීම, නැවත ලබා ගැනීම හා සකස් කිරීම සිදුකරගත හැකි විද්‍යුත් උපකරණයකි.
   (4). පරිගණකය යනු ප්‍රමාණාත්මක දත්ත පමණක් නිවැරදිව හා ඉක්මණින් ගබඩා කිරීම, නැවත ලබා ගැනීම හා සකස් කිරීම සිදුකරගත හැකි විද්‍යුත් උපකරණයකි.

3. පරිගණකය හා යතුරුපුවරුව අතර සිදුවන සන්නිවේදනය හැඳින්වීමට වඩා සුදුසු වන්නේ,
   (1). ඒකපථ
   (2). අර්ධ ද්විපථ
   (3). පූර්ණ ද්විපථ
   (4). ස්වයංක්‍රීය

4. ජංගම දුරකථනවල භාවිත වන මෙහෙයුම් පද්ධතියක් වන්නේ,
   (1). Windows Vista
   (2). Android
   (3). Windows XP
   (4). ඉහත සියල්ලම

5. (y)x හි x පාදය වන අතර y සංඛ්‍යාව වේ. මෙමගින් නිරූපණය විය හැකි කුඩාම අගය කුමක්ද?
   (1). $(1111)_2$
   (2). $(1111)_8$
   (3). $(1111)_{10}$
   (4). $(1111)_{16}$

6. 1500 KB සහ 3×2^3 KB ධාරිතාවන්ගෙන් යුතු ගොනු 2ක් ඔබ වෙත ලැබී ඇත. මෙම ගොනු දෙක ගබඩා කිරීම සඳහා ඔබ භාවිත කරන ආචයන උපාංගයේ තිබිය යුතු අවම ධාරිතාවය කුමක්ද?
   (1). 2 MB
   (2). 2000 KB
   (3). 1 GB
   (4). 2.5 MB

7. 0.00038920 සංඛ්‍යාවේ අඩුම වෙසෙසි අගය හා වැඩිම වෙසෙසි අගය කුමක්ද?

(1). 0 සහ 2
(2). 3 සහ 0
(3). 0 සහ 0
(4). 2 සහ 3

8. සිසුවෙකු විසින් ප්‍රශ්න පත්‍රයක ප්‍රශ්න 3කට පිළිතුරු ලබාදිය යුතු අතර මෙහිදී X හා Y යන ප්‍රශ්න 2ට අනිවාර්යෙන් පිළිතුරු ලබාදිය යුතු අතර තෙවන ප්‍රශ්නය ලෙස S හා T යන දෙකෙන් එක් ප්‍රශ්නයකට පිළිතුරු ලබාදිය යුතුය.
මෙම අවස්ථාව නිරූපණය කිරීම සඳහා නිවැරදි ප්‍රකාශනය පහත ප්‍රකාශවලින් තෝරන්න.

(1). X OR Y AND S OR T
(2). X AND Y AND (S OR T)
(3). X OR Y AND S AND T
(4). X AND Y AND (S AND T)

9. මෙම තාර්කික පරිපථයේ ප්‍රතිදානය 0 වේ.



ප්‍රතිදානය 0 වනවිට තිබිය හැකි නිවැරදි ආදාන සංයෝගය විය නොහැක්කේ,

(1). 0 , 1
(2). 1 , 0
(3). 0 , 0
(4). 1 , 1

10. පහත ඒවායින් පරිගණකයක් තුළ අනුලක්ෂණ නිරූපණයට භාවිතවන කේත ක්‍රමයක් නොවන්නේ,

(1). EBCDIC
(2). UNICODE
(3). BCD
(4). BSD

11. පහත ප්‍රකාශ අතුරින් RGB සහ CMYK වර්ණ ආදේශක පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.

A - පරිගණක තිර මත හෝ රූපවාහිනී තිර මත RGB වර්ණ ආදේශක භාවිත වේ.
B – CMYK වර්ණ ආදේශක මගින් ලා නිල්, දම්, කහ සහ කළු වර්ණ නිරූපණය වේ.
C – RGB වර්ණ ආදේශක මුද්‍රණ කාර්යයන් සඳහා භාවිත කරයි.

(1). A සහ B පමණි.
(2). B සහ C පමණි.
(3). A පමණි.
(4). B පමණි.

12. පහත දී ඇති ඒකාකාර සම්පත් නිශ්චායකයේ (Uniform Resource Locator) A, B හා C යන කොටස් වලින් හැඳින්වෙන දෑ නිවරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.



(1). A - නියමාවලිය B - වසම් නාමය C - විවෘත කර ඇති ලේඛනය
(2). A - ආරක්ෂිත නියමාවලිය B - වසම් නාමය C - ලේඛනය අයත් ගොනුව
(3). A - නියමාවලිය B - වසම් නාමය C - ඉහළ මට්ටමේ වසම
(4). A - ආරක්ෂිත නියමාවලිය B - අන්තර්ජාල සේවාව C - විවෘත කර ඇති ලේඛනය

13. එක් ලිපියක් ලබන්නන් කිහිප දෙනෙකුට යැවිය හැකි ආකාරයට වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් පහසුවෙන් සකස් කර ගත හැක. වදන් සැකසුම් මෘදුකාංගයක තිබෙන මෙම පහසුකම හඳුන්වන්නේ,

(1). Mail join
(2). Mail copy
(3). Mail insert
(4). Mail merge

14. මතීෂට ඔහුගේ සමර්පණයක් සඳහා බහුමාධ්‍ය සම්පත් ඇතුළත් කිරීම අවශ්‍යව ඇත. ඔහු අන්තර්ජාලයෙන් ලබාගන්නා බහුමාධ්‍ය සම්පත් ඒ ආකාරයෙන්ම පිටපත් කර නොගෙන ඒවායේ අධිසම්බන්ධතා පමණක් ඇතුළත් කරයි. මෙම ක්‍රියාව සම්බන්ධයෙන් දැක්වෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1). වැඩි බහුමාධ්‍ය සම්පත් ප්‍රමාණයක් ඇතුළත් කළ හැකිවීම
(2). වඩාත් අන්තර් ක්‍රියාකාරීවීම
(3). සමර්පණය වීඩියෝ සහිතව ඉක්මණින් පෙන්විය හැකිවීම
(4). සමර්පණ ගොනුවේ ධාරිතාවය සාපේක්ෂව අඩුවීම

15. පහත ඒවායින් ආගන්තුක යතුර සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1). එය වගු 2ක් අතර පමණක් තිබිය හැකි වීම.
(2). එමගින් වගු දෙකක රෙකෝඩ ඉවත් කළ හැකි වීම
(3). මෙමගින් වගු දෙකක් අතර සම්බන්ධතාවය ගොඩනැගිය හැකිවීම
(4). ආගන්තුක යතුර යනු ප්‍රාථමික යතුරට භාවිත කරන තවත් නමක් වීම

16 හා 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන භාවිත කරන්න.



16. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1). BookID යනු Books වගුවේ ප්‍රාථමික යතුර වන අතර Author ID යනු Author වගුවේ ආගන්තුක යතුර වේ.
(2). ඉහත වගු දෙක අතර සම්බන්ධතාවය ඒක බහු වේ.
(3). ISBN යනු Books වගුවේ ප්‍රාථමික යතුර වේ.
(4). AuthorIDFK යනු Author වගුවේ ආගන්තුක යතුර වේ.

17. ඉහත වගු ඇසුරෙන් සංයුක්ත ක්ෂේත්‍රයක් සඳහා වඩාත් ගැලපෙන ක්ෂේත්‍ර වන්නේ,

(1). ISBN
(2). LastName සහ FirstName
(3). BookID සහ ISBN
(4). AuthorIDFK

18. පහත දැක්වෙන ආදාන ප්‍රතිදාන උපාංග අතුරෙන් සුපිරි වෙළඳසැලක අයකැමි විසින් භාවිත කළ හැකි උපාංග වන්නේ,

A - Magnetic strip card reader
B - QR කියවනය
C – MICR
D – තිත් න්‍යාස මුද්‍රණ යන්ත්‍රය

(1). A සහ B පමණි
(2). A, B සහ D පමණි
(3). B සහ D පමණි
(4). A, B, C, D සියල්ලම

19. පරිගණකගත තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය විය හැක්කේ පහත ඒවායින් කවරක්ද?

A ආයතනයේ ප්‍රමාණය වැඩිවීමත් සමග දත්තවල ප්‍රමාණය ඉහළ යාම
B පවතින දත්ත ඇසුරෙන් කාලීන තීරණ ගැනීම අවශ්‍ය වූ විට
C පරිගණක ඇතිවිට
D ලිපිකරුවන් මගින් දත්ත සකස් කිරීම අපහසු වූ විට

(1). B සහ C
(2). A සහ B
(3). A සහ D
(4). C සහ D

20. පහත ප්‍රකාශ අතුරින් දියඇලි ආකෘතිය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශයන් වනුයේ,

A – එය මෘදුකාංග සංවර්ධනය සඳහා යොදා ගැනෙන අනුක්‍රමික ආකෘතියක් වේ.
B – ඕනෑම අදියරකදී පරිශීලකයාට අවශ්‍ය ප්‍රතිචාරයක් ලබාදිය හැක.
C – ස්ථාවර අවශ්‍යතා සහිත ව්‍යාපෘති සඳහා මෙය භාවිත කළ හැක.

(1). A සහ B පමණි
(2). A සහ C පමණි
(3). A, B සහ C සියල්ලම
(4). A පමණි

21. .gif, .jpg, .bmp සහ .png යනු ගොනු දිගු වන අතර ඒවා භාවිතවන ගොනු වන්නේ,

(1). audio ගොනු
(2). image ගොනු
(3). video ගොනු
(4). text ගොනු

22. A තීරුවෙන් ග්‍රාපික වර්ග පෙන්නුම් කරන අතර B තීරුවෙන් ඒවායේ ලක්ෂණ පෙන්නුම් කරයි. අදාල ග්‍රාපික වර්ගය සමග නිවැරදි ලක්ෂණ ගලපන්න.

A තීරුව	**B** තීරුව
A-වෙක්ටර් ග්‍රාපික	1 - Adobe Photoshop යනු උදාහරණයකි
B-රාස්ටර් ග්‍රාපික	2 - Adobe Illustrator යනු උදාහරණයකි
	3 – පික්සෙල් ආරාවක් අන්තර්ගත වේ.
	4 - වක්‍රාකාර හා හැඩ රේඛා අන්තර්ගත වේ.

(1). A – 1,3 B – 2,4
(2). A – 1,4 B – 2,3
(3). A – 2,3 B – 1,4
(4). A – 2,4 B – 1,3

23. ද්විමාණ සජීවීකරණ හා ත්‍රිමාණ සජීවීකරණ භාවිත කරන්නේ පහත ඒවායින් කුමන මෘදුකාංග මගින්ද?
(1). Adobe Flash සහ 3Ds MAX
(2). Dream viewer සහ 3Ds MAX
(3). Adobe photoshop සහ Blend
(4). Adobe photoshop සහ GIM

24. අධිසම්බන්ධතාවයක් ගොඩනැගීම සඳහා භාවිත කළ හැකි නිවැරදි කේතය වන්නේ,
(1). ministry of education
(2). ministry of education
(3). <http:// http://www.moe.gov.lk
(4). url=” http://www.moe.gov.lk “>ministry of education

25. වෙබ් අතරික්සුවක් හරහා පහත ප්‍රතිදානය ලබාදීම අවශ්‍ය HTML කේත ඛණ්ඩය වන්නේ,

Courses

Programming languages	
JAVA	Pascal

(1). <table>
<caption><h1>Courses</h1></caption>
<tr><th colspan=”2”>Programming languages</th></tr>
<tr><td>JAVA</td><td>Pascal</td></tr>
</table>

(2). <table>
<caption><h1>Courses</h1></caption>
<tr><th>Programming languages</th></tr>
<tr><td>JAVA</td><td>Pascal</td></tr>
</table>

(3). <table>
Courses
<tr><th colspan=”2”>Programming languages</th></tr>
<tr><td>JAVA</td><td>Pascal</td></tr>
</table>

(4). <table>
<caption><h1>Courses</h1></caption>
<tr><td colspan=”2”>Programming languages</td></tr>
<tr><td>JAVA</td><th>Pascal</th></tr>
</table>

26. HTML භාවිතයෙන් වෙබ් පිටුවක් නිර්මාණය සඳහා යොදාගත හැකි මෘදුකාංගයක් වන්නේ,
(1). Notepad
(2). MS FrontPage
(3). Adobe Dream viewer
(4). ඉහත සියල්ලම

27. රටක සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ දැක්වීමේදී පහත ප්‍රකාශ ඇසුරින් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
(1). රජයේ ආයතනවල සියලුම කටයුතු පරිගණකගත කිරීම
(2). අධ්‍යාපනික මෘදුකාංග පාසල් තුළ භාවිතය
(3). දත්ත සන්නිවේදනය සඳහා පරිගණක ජාල භාවිතය
(4). සෑම නිවසකටම පරිගණකයක් නොමිලයේ ලබා දීම

28. පහත ප්‍රතිදානය ලබාගැනීම සඳහා සුදුසු ව්‍යාජ කේතය වන්නේ,

```
*
* * *
* * * * *
* * * * *
```

(1)
```
For y = 1 to 5 step 2 do
        for x=1 to y do
    Print " * "
  Next x
next y
print "* * * * *"
```

(2)
```
For y = 1 to 5 do
    for x=1 to y do
        Print " * "
    Next x
next y
print "* * * * *"
```

(3)
```
For y = 1 to 5 step 2 do
    for x=1 to 5 step 2 do
        Print " * "
    Next x
next y
print "*"
```

(4)
```
For y = 1 to 3 do
    for x=1 to 5 do
        Print " * "
    Next x
next y
```

ප්‍රශ්න අංක 29 හා 30 සඳහා පිළිතුරු සැපයීමට පහත පැතුරුම්පත භාවිතයට ගන්න.

	A	B	C	D	E
1	ශිෂ්‍ය සංඛ්‍යා				
2	වර්ෂය	විෂයය	ගැහැණු ළමුන්	පිරිමි ළමුන්	එකතුව
3	2016	වාණිජ	50	34	84
4		විද්‍යා	30	45	75
5		කලා	45	62	107
6	2017	වාණිජ	40	42	82
7		විද්‍යා	40	45	85
8		කලා	50	0	50
9					
10	වාණිජ විෂයය - මුළු සිසුන් ගණන				90
11	කලා විෂයය - මුළු සිසුන් ගණන				70
12	විද්‍යා විෂයය - මුළු සිසුන් ගණන				95
13	වාණිජ හා විද්‍යා විෂයය - මුළු සිසුන් ගණන				160
14					

29. E13 කෝෂයේ ඇතුළත් කළ යුතු ශ්‍රිතය වන්නේ,

(1). =sum(C3:D4andC6:D7)
(2). =sum(C3: D7)
(3). =sum(C3:D4, C6:D7)
(4). =sum(C3:D4: C6:D7)

30. මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් එක් එක් විෂය හදාරන ශිෂ්‍ය ප්‍රතිශතය පෙන්වීමට වඩාත් සුදුසු ප්‍රස්තාර වර්ගය වනුයේ,

(1). තීරු ප්‍රස්තාර (Bar Chart)
(2). ස්ථම්භ ප්‍රස්තාර (Column Chart)
(3). විසිරි ප්‍රස්තාර (Scattered Chart)
(4). වට ප්‍රස්තාර (Pie Chart)

31. සමර්පණයක් ඉදිරිපත් කිරීමට යාමේදී, F5 මගින් අපේක්ෂිත කාර්යයක් නොවන්නේ,

(1). View show
(2). Slide show
(3). Continue presentation
(4). Run presentation

32. පහත රූප සටහන් මගින් ජාල සඳහා භාවිතවන කේබල වර්ග 3ක් පෙන්නුම් කරයි.

A


B


C

ඉහත කේබල වර්ග නිවැරදිව නම්කර ඇති පිළිතුර වන්නේ,

(1). A - ප්‍රකාශ තන්තු B - සමෝක්ෂ යොත් C - ඇඹරුම් යුගල
(2). A - සමෝක්ෂ යොත් B - ප්‍රකාශ තන්තු C - ඇඹරුම් යුගල
(3). A - ඇඹරුම් යුගල B - සමෝක්ෂ යොත් C - ප්‍රකාශ තන්තු
(4). A - ප්‍රකාශ තන්තු B - ඇඹරුම් යුගල C - සමෝක්ෂ යොත්

33. දත්ත සන්නිවේදනයේදී පරිගණක ජාල තුළ පවතින නීති පද්ධතිය හැඳින්වෙන්නේ,

(1). නියමාවලි (Protocols)
(2). සම්මතයන් (Standards)
(3). RFCs
(4). ඉහත කිසිවක් නොවේ.

ප්‍රශ්න අංක 34 හා 35 සඳහා පිළිතුරු සැපයීමට මෙම ගැලීම් සටහන භාවිත කරන්න.

.



34. මෙම ගැලීම් සටහනට අනුව ප්‍රතිදානය විය හැක්කේ,
    (1). 1, 2, 4, 6, 11
    (2). 1, 2, 4, 7, 11, 16
    (3). 1, 2, 4, 7, 11, 16, 16
    (4). 1, 2, 4, 7, 11, 16, 22

35. 1, 2, 4, 7, 11, 16 ලෙස ප්‍රතිදානය ලබා ගැනීමට කොන්දේසිය වෙනස් කරන්නේනම් පහත ඒවායින් කවරක්/කවර කොන්දේසි නිවැරදි ප්‍රතිදානය ලබා දෙයිද?

A - x <16 ද?
B - x<=15 ද?
C - x <=16 ද?

(1). A සහ B පමණි
(2). A සහ C පමණි
(3). B සහ C පමණි
(4). A , B සහ C සියල්ලම

36. පහත මෘදුකාංග අතුරින් ක්ෂණික පණිවිඩ යැවීම සඳහා භාවිතවන මෘදුකාංගයක්/මෘදුකාංග ලෙස සැලකිය හැක්කේ,

(a) WhatsApp
(b) Google Talk
(c) Viber

(1). (a) සහ (b) පමණි
(2). (b) සහ (c) පමණි
(3). (a) පමණි
(4). (a), (b) සහ (c) සියල්ලම

37. පරිගණක ක්‍රමලේඛ පිළිබඳ විශේෂ දැනුමැති පුද්ගලයෙකු වෙනත් කෙනෙකුගේ පරිගණකයක තිබෙන පෞද්ගලික දත්ත වෙත පිවිසීම හෝ නීත්‍යානුකූල නොවන ලෙසින් ලබා ගැනීම හෝ එම දත්තවලට හානි කිරීම හැඳින්විය හැකි නම තෝරන්න.
(1). Spammer
(2). විශ්ලේෂක
(3). phisher
(4). hacker

38. පහතින් දැක්වෙන්නේ ඉගෙනුම් කළමණාකරන පද්ධතියක් පිළිබඳ වන අතර ඒවායින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඉගෙනුම් කළමණාකරන පද්ධතියක් භාවිතයේදී ඇතිවිය හැකි අභියෝගයක් නොවන්නේ,
(1). උපස්ථ පිටපත් තබා ගැනීම අවශ්‍ය නොවීම
(2). පද්ධතිය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය
(3). මිනිසුන්ගේ සෘණ ආකල්ප
(4). මෙම පද්ධති භාවිතය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරභාවය අවශ්‍ය නොවීම

39. ප්‍රකාශන හිමිකම සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වනුයේ,

(1). කතෘට ප්‍රකාශන හිමිකම සම්බන්ධයෙන් ලිඛිත ලියවිල්ලක් ලැබෙන්නේනම් වඩාත් ඵලදායී වේ.
(2). මෙය පරිගණක මෘදුකාංග සඳහා පමණක් අදාල වේ.
(3). යම්කිසි කාර්යක් සඳහා ප්‍රකාශන හිමිකම ලබා ගැනීම සඳහා කතෘ විසින් ලියාපදිංචි විය යුතුය.
(4). යම් අයෙකුගේ මුල් කාර්යය සඳහා ප්‍රකාශන හිමිකම ස්වයංක්‍රීයව ලැබේ.

40. අංකිත බෙදුම අවම කිරීම සඳහා පහත ඒවායින් විසඳුමක්/විසඳුම් ලෙස ගත හැක්කේ මොනවාද?

A – දුෂ්කර පාසල් සඳහා පරිගණක හා අනෙකුත් සම්පත් බෙදාදීම
B - අදාළ පුද්ගලයින්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම
C - දෛනික කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
D – සෘණාත්මක අදහස් ඇති පුද්ගලයින්ට දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(1). A සහ B පමණි
(2). A, B සහ D පමණි
(3). B සහ D පමණි
(4). ඉහත සියල්ලම

ඉන්ටනෙට් සෙල්ලම
දිනක වේදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි